# <u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව</u>

එස්. ගුණවර්ධන,
අංක 93/1A, සේනානායක මාවත,
නාවල.

<u>**අභියාචක**</u>

**අභියාචනා අංකය : 580/2021**

එදිරිව

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව,
ශ්‍රී ජයවර්ධනපුර.

<u>**පොදු අධිකාරිය**</u>

**ඉදිරිපිටදී** : 1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
3. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම** : අභියාචක දුඃක අංක 071 3447882 ඔස්සේ සම්බන්ධ වේ.
පොදු අධිකාරිය වෙනුවෙන් නගර සැළසුම්කාර කේ.සුගිර්තන් මයා පෙනී සිටී.

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - ඉදිරිපත් කර නැත.
පොදු අධිකාරිය - ඉදිරිපත් කර නැත.

**විභාග කළ දිනය** : 2022.05.04, 2022.05.20, 2022.06.08

**තීරණය කළ දිනය** : 2022.06.08

<u>**තීරණය :**</u>

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක විසින් 2020.11.17 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

*"85/17 සේනානායක මාවත, නාවල වරිපනම් අංකයෙහි,*

1. *ඉහත වරිපනම් අංකය නිවාස හෝ වාණිජ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර මහ නගර සභාවෙන් අවශ්‍ය අනුමැතිය ලබාගෙන තිබේද?*

*එසේ නම්,*

*(අ) අනුමත කරන ලද මහල් ගණන ?*

*(ආ) ගොඩනැගිල්ල සඳහා පසුපස මායිමේ සිට අනුමත දුර කුමක්ද?*

2. *ඉහත සඳහන් වරිපනම් අංකයට අනුව 2020 වර්ෂයේදී ප්‍රතිසංස්කරණය, සංශෝධනය, වෙනස් කිරීම,එකතු කිරීම හෝ අතිරේක මහලක් ඉදිකිරීම සඳහා මහ නගර සභාව කිසියම් අනුමැතියක් ලබා දී තිබේද?*

3. *ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ක්‍රියාවලියට අනුව නගර සභා සැලසුම් අංශයට පහත සඳහන් සංවිධානවලින් අවශ්‍ය අනුමැතිය ලැබී තිබේද?*

   *(අ) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO)?*

   *(ආ) ව්‍යුහාත්මක ඉංජිනේරු?"*

ඒ අනුව, තොරතුරු නිළධාරි විසින් 2020.11.17 වන දින තොරතුරු ඉල්ලීම ලැබුණු බව දන්වා ඇති අතර තොරතුරු නිළධාරි 2020.12.10 දිනැතිව පිළිතුරු සපයමින්, *"2020.11.17 දිනැති ඉල්ලීමෙන් විමසා ඇති තොරතුරු පුද්ගලික තොරතුරක් බැවින්, එම තොරතුරු ලබා දිය නොහැකි බව"* දන්වමින් තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත.

එම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක විසින් 2020.12.18 දිනැතිව නම්කළ නිළධාරී වෙත අභියාචනයක් යොමු කර ඇත.

නම්කළ නිළධාරි විසින් ද තොරතුරු නිලධාරිගේ තීරණයම සනාථ කරමින්, 2021.01.04 දිනැතිව පහත පරිදි පිළිතුරු සපයා ඇත.

> *" 2020.12.10 දිනැති අභියාචනයෙහි සඳහන් තොරතුරු පුද්ගලික තොරතුරක් බැවින්, එම තොරතුරු ලබා දිය නොහැකි බව"* දන්වා ඇත.

එම ප්‍රතිචාරයෙන් ද අතෘප්තියට පත් අභියාචක විසින් 2021.01.11 දිනැතිව කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය යොමු කර ඇත.

## සළකා බැලීම

අද දින පොදු අධිකාරිය වෙනුවෙන් සහභාගි වන නගර සැළසුම්කාර කේ.සුගිර්තන් මහතා විසින් 2022.05.04 දාතමින් යුත් ලිපිය ඉදිරිපත් කරමින් එවැනි අංකයක් (එනම් 85/17) නාවල, සේනානායක මාවතේ නොමැති බවට සඳහන් කරමින් තොරතුරු සැපයීමක් මෙම කොමිෂන් සභාව වෙත සිදු කර ඇත. එහි පිටපතක්ද අභියාචක වෙත යවා ඇත.

තොරතුරු ඉල්ලීම ලද පොදු අධිකාරියේ තොරතුරු නිලධාරිගේ සහ නම් කළ නිලධාරිගේ මීන් පෙර දරණ ලද ස්ථාවරය වූයේ ඉල්ලා ඇති තොරතුරු පෞද්ගලික තොරතුරු බැවින් අදාළ තුන්වන පාර්ශවයෙන් නොවිමසා ලබා දිය නොහැකි බවය. මේ අනුව 2022.05.04 දිනැති ලිපියේ ස්ථාවරයත් ඊට පෙර දරණ ලද ස්ථාවරයත් අතර බරපතල විශමතාවයක් ඇත.

පරීක්ෂණයේදී ඉහත සඳහන් පොදු අධිකාරියේ නිලධාරි සඳහන් කරන අන්දමට අභියාචක තම තොරතුරු ඉල්ලීමෙහි සඳහන් කළ ස්ථානයේ 85/17 දරණ අංකයෙන් යුතු ගොඩනැගිල්ලක් නොමැති වුවත්, මෙම ස්ථානයෙහි අංක රහිත අනවසර මහල් කිහිපයකින් යුත් තනාගෙන යනු ලබන ගොඩනැගිල්ලක් ඇති බවය. මේ අනුව අභියාචක විමසන ස්ථානයෙහි ඇති අංක රහිත ගොඩනැගිල්ලෙහි තොරතුරු පුද්ගලික තොරතුරු සේ සැලකීමට නියමිත අනුමැතියක් ලබාගත් පුද්ගලයෙකු නොමැති බැවින් එකී අනවසර ගොඩනැගිල්ලට අදාළ තොරතුරු කිසි ලෙසකින්වත් තෙවන පාර්ශවයකට අදාළ පුද්ගලික තොරතුරු නොවේ. එබැවින්, එකී තොරතුරු මුදා හැරීමට පොදු අධිකාරිය කිසිදු බාධාවකින් තොරව බැඳී සිටී.

එබැවින්, 85/17 දරණ අංකය නොමැති වුවද අභියාචක සඳහන් කරනු ලබන ස්ථානය පොදු අධිකාරිය හඳුනාගෙන ඇති බැවින් එකී ස්ථානයේ ඇති අභියාචක සඳහන් කරනු ලබන මහල් කිහිපයකින් යුත් ගොඩනැගිල්ල පිළිබඳ තොරතුරු ලබා දීමට පොදු අධිකාරිය බැඳී සිටී.

ඉහත කරුණු සළකා බලා උක්ත සඳහන් කරන ලද අභියාචකගේ තොරතුරු ඉල්ලීමේ අන්තර්ගත ඉහත කී අංක 85/17 දරණ අංකය නොමැති ස්ථානයෙහි පිහිටි මහල් ගොඩනැගිල්ල පිළිබඳ තොරතුරු 2022.06.29 වන දිනට ප්‍රථම, කොමිෂන් සභාව වෙත පිටපත් සහිතව, අභියාචක වෙත මුදා හැරීමට පොදු අධිකාරිය ක්‍රියා කළ යුතු බවට තීරණය කරමු.

කොමිෂන් සභාවේ මෙම තීරණයට අනුකූලව ක්‍රියා කිරීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම්, තොරතුරු නිලධාරිට සහ පොදු අධිකාරියට එරෙහිව 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව නියමිත මහේස්ත්‍රාත් අධිකරණයෙහි නඩු පැවරීමට ක්‍රියාකළ යුතු බවට කොමිෂන් සභාව තීරණය කරයි.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය වෙත, තොරතුරු නිලධාරි වෙත සහ අභියාචක වෙත දන්වා යැවීමට කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

මෙම අභියාචනය අවසන් කරනු ලැබේ.